



LAW & SOCIETY TRUST

# ප්‍රජාතන්ත්‍රවාදී සංවාදය, ක්‍රියාකාරී සවන්දීම සහ පුරවැසි සහභාගිත්ව අන්තර්ගතය: වසංගත සහ සමාජ අර්බුද අවස්ථාවන්හීදී පුරවැසි සහභාගිත්වය අන්තර්ගත කිරීම සඳහා අවකාශ නිර්මාණය කිරීම

මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ශ්‍රී ලංකාව මුහුණපානු ලබන වසංගත සහ සමාජ- ආර්ථික අර්බුද අතරතුර පුරවැසි සහභාගිත්වය ඇති කිරීම සඳහා අවකාශ නිර්මාණය කිරීම සහ ප්‍රජාතන්ත්‍රවාදී ආයතන, නීතියේ ආධිපත්‍යය සහ මහජන වගවීම ශක්තිමත් කිරීමයි. වගකිවයුතු පුරවැසියන් ලෙස අපි

ව්‍යාවස්ථානුකූලභාවය පිළිබඳ මූලධර්ම හා බැඳුණු අර්බුදයන්ට රජය විසින් ප්‍රතිචාර දැක්වීම තහවුරු කර ගැනීමට සහ රජය විසින් විශේෂයෙන් වැරදි තොරතුරු සහ වෛරී අදහස් හුවමාරු වීම වැළැක්වීම තහවුරු කිරීමට මෙන්ම වෙනස්කම් සිදු කරන්නන්ගේ සහ බලපෑම් ඇති කරන්නන්ගේ ධනාත්මක මැදිහත්වීම තුළ සමාජ සහයෝගීතාව ශක්තිමත් කිරීමට බලාපොරොත්තු වෙමු.

මෙම අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා, ව්‍යාපෘතිය මඟින් සෞඛ්‍යය සහ ආර්ථික අභියෝග සඳහා රජය විසින් ලබා දෙන වේගවත් ප්‍රතිචාර විශ්ලේෂණය කිරීම සඳහා නිල නොවන "පුරවැසි විමසුමක්" ස්ථාපිත කර ඇත. මෙමඟින් ප්‍රතිපත්ති ගැටලු සඳහා මහජන කථිකාවක් ප්‍රවර්ධනය කිරීම, මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් ලේඛනගත කිරීම; ප්‍රජාතාන්ත්‍රික වටිනාකම් වලට බලපෑම් කරන අන්දමින් පැනනඟින ගැටලු වලට පුරවැසියන්ට කාලෝචිත සහ සාධක හේතු කරගත් තොරතුරු සැපයීම සිදු කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය මඟින් තවදුරටත් ප්‍රජාතන්ත්‍රවාදය සහ නීතියේ ආධිපත්‍යය ශක්තිමත් කිරීමට දැනුවත් කිරීමේ ව්‍යාපාර දියත් කිරීමට මෙන්ම පුරවැසියන් හට පශ්චාත්- වසංගත සන්දර්භය තුළ තමන්ගේ අවශ්‍යතාවන්, උද්වේගයන් සහ අපේක්ෂාවන් ගෙනහැර දැක්වීමට හැකිවන අවශ්‍යතා ඇගයීමක් දියත් කිරීමට බලාපොරොත්තු වෙයි.

මෙම ව්‍යාපෘතියට දායකවීමක් ලෙස මයිකල් මෙන්ඩිස් විසින් මෙම වාර්තාව ලියන ලදී. විධායක අධ්‍යක්ෂ, ආචාර්ය සකුන්තලා කදිර්ගාමර් මෙම පත්‍රිකාව සමාලෝචනය කළාය. මෙම පත්‍රිකාව සංකල්පනය කිරීම සඳහා ලබා දෙන ලද සහයෝගය වෙනුවෙන් අර්මීසා ටීගල් (නීතිඥ) මහත්මියට විශේෂ ස්තුතිය පිරිනමනු ලැබේ. නීතිය හා සමාජ භාරය එම මහත්ම මහත්මීන් මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් දැක්වූ කැපවීම ඇගයීමට ලක් කරයි.
මෙම ලිපියෙහි පළ කර ඇති අදහස් වලින් ඉඳුරා ම නීතිය හා සමාජ භාරයෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ කළමනාකාරීත්වයේ අදහස් පිළිබිඹු නොකෙරෙයි.

## පිටකවරය නිර්මාණය: සංගීත් මදුරාවල විසිනි

# කෝවිඩ්-19 වසංගතය සමයේ ශ්‍රී ලාංකීය රාජ්‍යය සහ අපගේ පුද්ගලික නිදහස පිළිබඳ කථා කරමු

## හැඳින්වීම

2020 වර්ෂයේ දී මුළු ලෝකය ම තම ග්‍රහණයට නතු කරගත් කෝවිඩ්-19 වසංගතය ලොව සෑම තැනකම ඇති සමාජයන් මත බලපෑම් එල්ල කරමින් තිබේ. වසංගතයෙන් එල්ල වූ පීඩනයත් සමග, එම සමාජවල කලින් සිට පැවති අසමානතා තවත් උග්‍ර වී තිබේ. වසංගතයට ප්‍රබල ප්‍රතිචාරයක් දැක්වීමේ අවශ්‍යතාවය සහ බලය යොදාගනිමින්, ඒකාධිපති ක්‍රියාමාර්ග පවා ගනිමින් කටයුතු කිරීමේ අවශ්‍යතාවය රජයයන් විසින් පටලවාගෙන තිබේ. මහජනතාව ගෙන් හෝ ඔවුන්ගේ ව්‍යවස්ථාදායක නියෝජිතයින් ගෙන් අදහස් විමසීම හෝ ඔවුන් වෙත පැහැදිලි කරදීම් ලබාදීම සිදුවන්නේ සුළු වශයෙනි.

වසංගත කාලය තුළ පුද්ගලික නිදහස උල්ලංඝනයවීම් සම්බන්ධයෙන් අපි අවධානයෙන් සිටිමින් ඒවා අභියෝගයට ලක් කළ යුතුවේ. සාමාන්‍යයෙන්, පුද්ගලයින්ට "තමන්ගේ මග යෑම" සඳහා වන නිදහස අහිමි කිරීම පුද්ගලික නිදහස අහිමි කිරීම වශයෙන් ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සලකනු ලැබේ. පුරවැසියන්ට ඔවුන්ගේ පුද්ගලික නිදහස අහිමි කරනු ලැබුවහොත්, රාජ්‍යයේ සියළුම අංශ ඒ සම්බන්ධව නීතියෙන් විධිවිධාන සලසා ඇති කාර්යපටිපාටි දැඩි ලෙස ඉටු කළ යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් නියම කර තිබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සලසා දී ඇති ආරක්ෂණ තිබියදී පවා, කාලයත් සමග අත්තනෝමතික අත් අඩංගුවට ගැනීම් හා රඳවා තැබීම්වල ද අත් අඩංගුවේ පසුවන අතරතුර පීඩා පැමිණවීම් සහ මරණයට පත්වීම්වල ද ඉහළ යාමක් තිබේ. මෙය ප්‍රවනතාවයක් ලෙස සැලකීමට තරම් ප්‍රමාණවත් පරිදි මනාව තහවුරු වී තිබේ. එහෙත්, වසංගතය තවදුරටත් දිග්ගැස්සෙද්දී, මෙම අත්තනෝමතික අත් අඩංගුවට ගැනීම් හා රඳවා තැබීම් ද, අත් අඩංගුවේ සිටියදී පීඩා පැමිණවීම් හා මරණය සිදුවීම ද නොකඩවා සිදුවනවා පමණක් නොව, එය වසංගතයට රාජ්‍යය දක්වන ප්‍රතිචාරයෙහි කොටසක් බවට ද පත්වනු ශ්‍රී ලාංකිකයෝ දුටුවෝය.

අර්බුද අවස්ථාවලදී නීතිය ක්‍රියාත්මක කරන ආයතන සහ ජාතික ආරක්‍ෂක ආයතන බලයෙන් දැඩි වන අතර වසංගත අර්බුදය ද එයට වෙනස් නොවන්නකි. රජය විසින් 'දැඩි' ක්‍රියාමාර්ග ගත යුතු යැයි ඉල්ලා සිටින ලද අතර, වඩාත් 'ශක්තිමත්', 'කාර්යක්ෂම' සහ 'විනීත' මහජන සෞඛ්‍ය ප්‍රතිචාරයක් සඳහා වූ අවශ්‍යතාවය මගින් එය සාධාරණීකරණය කරන ලදී. කෙසේ වෙතත්, විශේෂයෙන්ම කැරළි දෙකකට සහ දශක ගණනක් පැවති සන්නද්ධ ගැටුමකට මුහුණ දුන් ශ්‍රී ලාංකිකයින්ට සහ ක්‍රමයෙන් දැඩි වෙමින් පවතින ආයතන වලට පොදුවේ ආකූල සම්බන්ධතාවයක් තිබේ. වඩාත් මෑතකදී, එනම් 2019 වර්ෂයේ දී, වසංගතය ආරම්භ වීමට වසරකට පමණ පෙර, පාස්කු ඉරුදින ප්‍රහාරවලින් පසුව දිවයිනේ විවිධ ප්‍රදේශවලින් මුස්ලිම් තරුණයින් විශාල පිරිසක් අත් අඩංගුවට ගෙන රිමාන්ඩ්භාරයට පමුණුවන ලදී. එම වර්ෂයේදී ම, හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ රටේ ජනාධිපතිවරයා වශයෙන් තේරී පත්වුණ අතර, සමාජය තුළ සහ රජය තුළ හමුදාවේ තත්වය සහ භූමිකාව වඩාත් පුළුල් කරන ක්‍රියාවලි ගණනාවක් ඔහු විසින් ආරම්භ කරන ලදී. ඉන් ඇතැම් වෙනස්කම් පෙර සිටම සිදුවෙමින් පැවති අතර, ජනාධිපතිවරණයෙන් මාස ගණනාවකට පසු වසංගතය ඇතිවීමත් සමග ඒවා තවදුරටත් ශක්තිමත් විය.

පැරණි ප්‍රවනතා එසේ අඛණ්ඩව පවතිද්දී, වසංගතය සඳහා ම විශේෂිත වූ ප්‍රතිචාරයක් ඇතිකිරීම සඳහා අළුත්, සහ වඩාත් සුවිශේෂී ක්‍රියාමාර්ග අවශ්‍ය යැයි සලකන ලදී. නිසැකවම, ලොව වටා විවිධ රටවල ද මේ හා සමාන ක්‍රියාමාර්ග අනුගමනය කරන්නට ඇත, එහෙත්, එම ක්‍රියාමාර්ග ශ්‍රී ලංකාවේ සුවිශේෂී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රශ්නයක් නිර්මාණය කළේය. මෙරට පළමු කෝවිඩ්-19 රෝගියා හඳුනාගැනීමට සති කිහිපයකට පෙර පාර්ලිමේන්තුව විසිරුවා තිබුණි. පාර්ලිමේන්තුවක් නොමැති වූ තත්වයක් තුළ,

සුළුතර, භාරකාර රජයක් යටතේ ශ්‍රී ලංකාව වසංගතයට මුහුණ දුන්නේ බොහෝ දුරට වික්ටෝරියානු යුගයේ හඳුන්වා දී තිබූ 'නිරෝධායන ආඥාපනත' මත යැපෙමින් විය. එම පසුබිම තුළ, ආරක්ෂක හමුදාවලට දරන්නට වූ වගකීම් බොහෝ විය. කොවිඩ් වසංගතය මර්දනය කිරීමේ ජාතික යාන්ත්‍රණයේ ප්‍රධානියා ලෙස යුධ හමුදාපතිවරයාව පත් කරන ලදී; [1] නිරෝධායන මධ්‍යස්ථාන පවත්වාගෙන ගියේ, ඇඳිරිනීති මුර සංචාර සිදුකළේ, හදිසි අවස්ථා සලාක බෙදා දුන්නේ, සහ පොදු ස්ථාන විශබීජහරණය කළේ පවා හමුදාව විසිනි. සති කිහිපයක් ඇතුළත, මුළු දිවයිනම අගුළුදැමීම නොහොත් වසා දැමීම සිදු කරන ලද අතර, කෝවිඩ් වෛරසය ආසාදිත බවට සනාථ වූවන් සහ ඔවුන්ගේ සමීප ආශ්‍රිතයින් රජය විසින් පවත්වාගෙන යන ස්ථානවල නිරෝධායනයට ලක් කරන ලදී; ජාතික දේශසීමා තර කරන ලද අතර, ගමනාගමනය සහ ප්‍රවාහනය ය සමීප අධීක්ෂණයට ලක් කෙරුනි.

## කෝවිඩ් බලාත්මක කිරීම් සම්බන්ධ අත් අඩංගුවට ගැනීම්

දේශීය වශයෙන් කෝවිඩ් රෝගීන් හඳුනා ගැනීම පිළිබඳ ප්‍රවෘත්ති ලැබෙන්නට ගැනීමත් සමග 2020 මාර්තු මැද භාගයේ දී මූලික වශයෙන් දැක්වූ ප්‍රතිචාරය වූයේ රාජ්‍ය අංශයට රජයේ හා බැංකු නිවාඩු ප්‍රකාශයට පත් කිරීමත්, තම අභිමතය පරිදි ඒ හා සමාන ක්‍රියාමාර්ග ගන්නා ලෙස පෞද්ගලික අංශයෙන් ඉල්ලා සිටීමත් ය. ඒ අන්දමින් එම පළමු සතිය "නිවසේ සිට වැඩකරන" කාල සීමාවක් විය. කෙසේ වෙතත්, සති අන්තය වන විට මුළු දිවයිනට ම ඇඳිරිනීතිය ප්‍රකාශයට පත්කරන ලදී. නිරෝධායන සහ රෝග වැළැක්වීමේ ආඥාපනත යටතේ මෙම ඇඳිරිනීතිය පැනවූ බව කියැවුණු අතර එයට අනුකූලතාවය නොදක්වන අය අත් අඩංගුවට ගන්නා බවට මහජනයාට තර්ජනය කරන ලදී.[2] 2020 මාර්තු අවසානය වන විට, ඇඳිරි නීතිය ප්‍රකාශයට පත් කළ දින සිට එතෙක් අත් අඩංගුවට ගන්නා ලද පුද්ගලයින් සංඛ්‍යාව 6,850ක් බව පොලිස් මාධ්‍ය අංශයෙන් වාර්තා කළේය.([3]) ඒ සමග ම, "වරදකරුවන් (ඇඳිරිනීතිය උල්ලංඝනය කළ) සංඛ්‍යාවේ සහ ඇඳිරිනීති බලපත්‍ර අවභාවිතා කළ පුද්ගලයින් සංඛ්‍යාවේ ශීඝ්‍ර වැඩිවීම හේතුවෙන්... පොලිසියට සහාය ලබාදීම සඳහා සන්නද්ධ හමුදා සාමාජිකයින් යෙදවීමට"[4] රජය කටයුතු කළ බැවින්, ඇඳිරිනීතිය බලාත්මක කිරීම සඳහා හමුදාව ද සම්බන්ධ විය. අප්‍රේල් මාසයේ මැද භාගය වන විට අත් අඩංගුවට ගෙන තිබූ සංඛ්‍යාව 34,500 දක්වා ඉහළ ගොස් තිබුණි. [5] තවද, ඒ වන විට ශ්‍රී ලංකා පොලීසිය නිරෝධායන ආඥාපනත යටතේ පනවන ලද ඇඳිරිනීතිය සහ අනෙකුත් සෞඛ්‍ය මාර්ගෝපදේශ උල්ලංඝනය කරන පුද්ගලයින් සඳහා මාස හයක සිරදඬුවම් ලබා දෙන ලෙස ඉල්ලා සිටීමේ ප්‍රතිපත්තියක් ද අනුගමනය කරමින් තිබුණි.[6]

ඇඳිරි නීතිය උල්ලංඝනය කරන්නන් අත් අඩංගුවට ගැනීමේ ප්‍රතිපත්තිය ආරම්භ වූ කාලයේ ම, අනුරාධපුර බන්ධනාගාරයේ රැඳවූවන් අතර කෝවිඩ්-19 රෝගීන් හඳුනාගෙන ඇති බවට පැතිර ගිය භීතියත් සමග එම බන්ධනාගාරයේ ඇතිවූ කැරැල්ලේදී රැඳවූවන් දෙදෙනෙකු මිය ගියේය. බන්ධනාගාරවල පැවති අධික තදබදයක් සහිත රැඳවුම් තත්වය ඔවුන්ගේ ජීවිත අනතුරේ හෙලන්නේය යන ආතතිය බන්ධනාගාර තුළ වර්ධනය වන්නට විය. වසංගත තත්වය සැලකිල්ලට ගෙන මෙම බන්ධනාගාරගතවූවන් නිදහස් කරන ලෙස යෝජනා කරමින් සිවිල් සමාජය වෙනුවෙන් පෙනී සිටින්නන් ජනාධිපතිවරයා වෙත ලිපියක් යොමු කළ අතර,[7] අප්‍රේල් මස මුල් කාලය වනවිට "ජනාධිපතිවරයා විසින් පත් කරන ලද කමිටුවකින් ලබාදුන් නිර්දේශ පදනම් කරගෙන, බන්ධනාගාරගතවූවන් 2,961ක් අධිකරණයෙන් ලබා දුන් ඇප මත නිදහස් කරන ලදී."[8]

**රජයේ විශ්වවිද්‍යාලයක පරිපාලන කාර්යමණ්ඩලයේ සාමාජිකයකුගෙන් ලැබුණු ප්‍රකාශය (පුරුෂ, වයස අවු. 38, මඩකලපුව)**

*"ලොකුම අභියෝගය ගමන් බිමන් යන එක තමයි. දැන් අවුරුද්දකට වැඩි කාලයක ඉඳලා අපිට පිටතට යන්න බැරිවෙලා තියෙනවා. මේක හැමදෙනාටම පොදු ප්‍රශ්නයක්. මේ කෝවිඩ්-19 වසංගතයේ ස්වභාවයත් එක්ක හැම දෙයක්ම කළමනාකරණය කරගන්න වෙලා තියෙන්නේ නිරෝධායන නීතිය යටතේ. ඒත් එයාලාට අවශ්‍ය විදියට, එයාලාගේ අභිමතය පරිදි මේ නීතිය නමන්න බැහැ කියන එක ඒකෙන් අදහස් වෙන්නේ නැහැ. පුළුල් චිත්‍රය දිහා බැලුවොත්, මේ වසංගතය හැම දෙනාටම අමාරු කාලයක් නිර්මාණය කරලා තියෙන්නෙ. ඒ නිසා, මේ නීතිරීති සියල්ලටම අනුකූල වෙනවාට අමතරව අපි අනෙක් වැදගත් පැති ගැනත් හිතන්න ඕනැ. ජීවනෝපාය අහිමිවී යාම, ස්ථාවර මූල්‍ය තත්වයක් නොමැතිවීම, මෙන් ම අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය හිඟකම ද මිනිසුන්ගේ ජීවිතවල විවිධ අවහිරතා ඇතිවීමට හේතුවී තිබෙනවා. එම නිසා, මෙම වාතාවරණය යටතේ මිනිසුන්ගේ අයිතිවාසිකම් සහ නිදහස සම්බන්ධයෙන් සැලකිල්ල දැක්වීමත් ඉතාමත් වැදගත් වෙනවා."*

*"රට අභ්‍යන්තරයේ පිහිටා තිබෙන ප්‍රදේශවල පවා මිනිස්සු ලොක්ඩවුන් එක නොතකා බොහෝ වෙලාවට එහාමෙහා යන්නේ මේ ජීවනෝපාය ප්‍රශ්නයත්, අත්‍යාවශ්‍ය භාණ්ඩ මිලදීගැනීමේ ප්‍රශ්නයත් නිසා. එරාවූර් ප්‍රදේශයේ ඇතිවූ එක් සිද්ධියක දී, නිරෝධායන නීති නොතකා එහා මෙහා යෑම හේතුවෙන් මුස්ලිම් පුද්ගලයින් කිහිපදෙනෙකුව ප්‍රසිද්ධියේ දණගස්වා තියන්න යුධ හමුදාව සම්බන්ධ වෙලා තියෙනවා. සංචරණ සීමා උල්ලංඝනය කළ එම පුද්ගලයින්ට දණ ගසාගෙන, දැත් ඔසවාගෙන ඉන්න කියලා හමුදාවෙන් බලකරන ඡායාරූප කියලා ඡායාරූප කිහිපයකුත් සමාජ මාධ්‍යවල බොහෝ සෙයින් පැතිරිලා ගියා. මෙවැනි ක්‍රියා නිරෝධායන නීතිය යටතේ සිදු වෙන එක අපිට පිළිගන්න බැරි දෙයක්. පුළුල් චිත්‍රය දෙස බැලුවාම, තත්වය හරිම සංකීර්ණයි, ඒ වගේම දුෂ්කරයි. ඒ වාගේම, මේ වාගේ වැඩ, විශේෂයෙන්ම, ජනතාවගේ විවිධත්වය වැඩි නැගෙනහිර වගේ පළාතක. වෙනත් අහිතකර ප්‍රතිඵලවලටත් හේතුවෙන්න පුළුවන්. මෙවැනි හිරිහැරවලට මුහුණ දෙන මේ අය මුස්ලිම් ප්‍රජාවට අයිති අයයි."*

ඇඳිරි නීතිය උල්ලංඝනය කරන්නන් අත් අඩංගුවට ගැනීමේ ප්‍රතිපත්තිය ආරම්භ වූ කාලයේ ම, අනුරාධපුර බන්ධනාගාරයේ රැඳවූවන් අතර කෝවිඩ්-19 රෝගීන් හඳුනාගෙන ඇති බවට පැතිර ගිය භීතියත් සමග එම බන්ධනාගාරයේ ඇතිවූ කැරැල්ලේදී රැඳවූවන් දෙදෙනෙකු මිය ගියේය. බන්ධනාගාරවල පැවති අධික තදබදයක් සහිත රැඳවුම් තත්වය ඔවුන්ගේ ජීවිත අනතුරේ හෙළන්නේය යන ආතතිය බන්ධනාගාර තුළ වර්ධනය වන්නට විය. වසංගත තත්වය සැලකිල්ලට ගෙන මෙම බන්ධනාගාරගතවූවන් නිදහස් කරන ලෙස යෝජනා කරමින් සිවිල් සමාජය වෙනුවෙන් පෙනී සිටින්නන් ජනාධිපතිවරයා වෙත ලිපියක් යොමු කළ අතර,[9] අප්‍රේල් මස මුල් කාලය වනවිට "ජනාධිපතිවරයා විසින් පත් කරන ලද කමිටුවකින් ලබාදුන් නිර්දේශ පදනම් කරගෙන, බන්ධනාගාරගතවූවන් 2,961ක් අධිකරණයෙන් ලබා දුන් ඇප මත නිදහස් කරන ලදී."[10]

කෙසේ වෙතත්, මෙම අත් අඩංගුවට ගැනීම් අඛණ්ඩව සිදුවෙමින් තිබියදී පවා, මෙසේ පනවන ලද ඇඳිරිනීතියෙහි නීත්‍යානුකූලභාවය සම්පූර්ණයෙන් ම ප්‍රශ්න නොකර සිටියා නොවේ. උදාහරණයක් ලෙස ජනාධිපති නීතිඥ සහ විපක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.ඒ. සුමන්දිරන් මාධ්‍යයට මෙසේ පවසා තිබුණු බව වර්තා විය: "නීතිය අනුව මේ රටේ ඇඳිරිනීතියක් පනවා නැහැ. අපි හැමදෙනාම මේ ඇඳිරිනීතියට අනුකූල වෙන්නේ රටේ පවතින වත්මන් තත්වය නිසායි." [11] එහෙත්, ඒ සමගම ඔහු, "කොරෝනා වෛරසය පැතිරයාම පාලනය කළ හැකි හොඳම ක්‍රමය නිවෙස්වලට වී සිටීම බැවින් මෙම ඇඳිරිනීතියෙහි ඇති අස්ථාවර නීතිමය පදනම නොතකා මෙම ඇඳිරිනීතියට අනුකූලව කටයුතු කරන මෙන් ජනතාව ගෙන් ඉල්ලා සිටියේය''.[12]

ඇඳිරිනීතිය උල්ලංඝනය කළ පුද්ගලයින්ව පමණක් නොව, කෝවිඩ්-19 රෝගය වැළඳී ඇති බවට සැක කරන ලද කිසිවෙක් රෝහල්ගතවීම මගහරින්නට උත්සාහ කළ හොත්, එවැනි පුද්ගලයින්ව සහ එයට උපකාර කරන අය ද අත් අඩංගුවට ගන්නා බවට තර්ජනය කරන ලදී.[13] "අත්‍යාවශ්‍ය සේවා සැපයීමේ වැදගත් රාජකාරියෙහි නිරතව සිටින රාජ්‍ය නිලධාරීන් සහ සේවකයින් අනිසි ලෙස විවේචනය කරන අය පිළිබඳව හොඳින් පරීක්ෂාකාරීව සිට ඔවුන්ව අත් අඩංගුවට ගැනීමට කටයුතු කරන මෙන්'' එවකට වැඩබලන පොලිස්පතිවරයා විසින් පොලීසියට උපදෙස් දීමත් සමග අත් අඩංගුවට ගනු ලබන බවට තර්ජනය කිරීම වැරදි තොරතුරු පාලන කිරිමේ ක්ෂේත්‍රය දක්වා ද පැතිර ගියේ ය. [14]

එමෙන් ම, ප්‍රසිද්ධ විරෝධතාවල නිරත වූවන් ද අත් අඩංගුවට ගැනීමට සූදානම් බවට රජය ඇඟවීම් කළේය. 2020 ජූනි මාසයේදී, පෙරටුගාමී සමාජවාදී පක්ෂය විසින් Black Lives Matter (කළු ජාතිකයින්ගේ ජීවිත ද වැදගත් වේ) නැමති ගෝලීය ව්‍යාපාරයට සහයෝගය පළ කරමින් සංවිධානය කරන ලද පෙළපාළියකට සහභාගි වෙමින් සිටි පුද්ගලයින් පනස් තුන් දෙනෙකු අත් අඩංගුවට ගන්නා ලදී.[15] 2021 දී, රජයේ ප්‍රතිපත්තිවලට එරෙහිව විරෝධය දැක්වූ පුද්ගලයින්, විශේෂයෙන් ම විදුහල්පති-ගුරු වෘත්තීය සමිති ක්‍රියාමාර්ගය, කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාල (KNDU) පනත් කෙටුම්පතට එරෙහි විරෝධය, සහ රසායනික පොහොර සඳහා එක්වරම පැනවූ තහනමට එරෙහි විරෝධය වැනි විරෝධතා වලට සහභාගී වූ පුද්ගලයින් ගණනාවක් ම අත්අඩංගුවට ගන්නා ලදී.

එවැනි අත් අඩංගුවට ගැනීම් එලෙස සිදු වුව ද, බොහෝ ප්‍රසිද්ධ රැස්වීම් පැවැත්වීමට අවසර ලැබුණා පමණක් නොව ඒ සඳහා රජයේ ඉහළ පෙළේ පුද්ගලයින්ගේ අනුග්‍රහය ද ලැබුණි. 2020 වර්ෂයේ සිදු වූ සිදුවීම් අතරින් ඒ සඳහා එක් ප්‍රමුඛ උදාහරණයක් වන්නේ හිටපු අමාත්‍ය ආරුමුගම් තොන්ඩමන්ගේ අවමංගල්‍ය උත්සවයයි. Black Lives Matter රැලියේදී විරෝධතාකරුවන් 53 දෙනෙකු අත් අඩංගුවට ගැනීමට දින කිහිපයකට පෙර පැවති එම අවමගල්‍ය උත්සවයේදී අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ ඇතුළුව දහස් ගණනක් දෙනා තම අවසන් ගෞරව පුදකිරීම සඳහා එහි රැස් වූහ.[16] ඒ හා සමානව, 2021 වර්ෂයේ දී, කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාල පනත් කෙටුම පතට එරෙහිව විරෝධතා කළ පුද්ගලයින් අත් අඩංගුවට ගත් දිනයේ ම බැසිල් රාජපක්ෂ නව මුදල් අමාත්‍යවරයා ලෙස පත්වීම සමරමින් පැවැත්වූ මහජන රැස්වීම් බොහොමයක් සම්බන්ධයෙන් කිසිවක් සිදු නොනොකර ඒවා ඉවසා සිටින ලදී.

**රජයේ පාසල් ගුරුවරයකුගේ ප්‍රකාශය (පුරුෂ, අවු. 56, පේරාදෙණිය)**

*"සමාජ දුරස්ථභාවය පවත්වාගැනීමේ මාර්ගෝපදේශවලට අනුකූලව මහනුවර සහ කොළඹ පවත්වපු විරෝධතාවලට මමත් සම්බන්ධ වුනා. ඒ වගේම මහනුවර ඉඳලා කොළඹ දක්වා විරෝධතා පාගමනක් ගිය විදුහල්පතිවරුන්ටයි ගුරුවරුන්ටයි මමත් සම්බන්ධ වුනා. ඒ අයගෙන් බොහොම දෙනෙක්ව අත් අඩංගුවට පත් වුණා. අපි උභතෝකෝටික ප්‍රශ්නයකට මැදිවෙලා ඉන්න බව මම දන්නවා - මිනිසුන්ගේ සිවිල් දේශපාලන අයිතිවාසිකම් ආරක්ෂා කරනවාද, නැතිනම් නිරෝධායන නීති පවත්වාගෙන යනවාද? රජය අවස්ථාවාදී විදිහට මේ වාතාවරණය පාවිච්චි කරද්දී අපිත් අතහරින්න නරකයි. මේ අලුත් තත්වය යටතේ මේ ගැටළු දෙක අතරේ සමබරතාවයක් පවත්වාගැනීම හරිම වැදගත්. අධ්‍යාපන අයිතිය වෙනුවෙන් සිදු කළ අරගලයේදී සටන් කළ අය අත් අඩංගුවට ගැනීම පුද්ගල නිදහස සහ අයිතිවාසිකම්වලට එල්ල කරපු බරපතළ කනේ පහරක්."*

වසංගතය අතරතුර සිදුකෙරුණු මහජන විරෝධතා සමග අලුතින් ඉස්මතු වූ ප්‍රවනතාවයක් වන්නේ, පොලීසිය විරෝධතාකරුවන්ව අධිකරණයට ඉදිරිපත් කළ විට අධිකරණය ඔවුන්ව රිමාන්ඩ් භාරයට පත්කිරීම ප්‍රතික්ෂේප කළ විට පොලීසිය විසින් එම විරෝධතාකරුවන්ව නිරෝධායනයට ලක් කිරීමයි.[17] මෙම ප්‍රවනතාවය ආරම්භ වූයේ කොළඹ ඉහළ පෙළේ හෝටලයක පැවති උපන්දින සාදයකට සහභාගි වෙමින් ඇඳිරිනීති නියෝග උල්ලංඝනය කළ සුප්‍රකට චරිත කිහිපයක් නිරෝධායනයට ලක් කිරීමත් සමගිනි. [18] වැඩි කල් යන්නට මත්තෙන් අනෙකුත් විරෝධතාකරුවන්ව ද අධිකරණයෙන් ඇප ලබාදීමෙන් පසුව පවා බලහත්කාරයෙන් නිරෝධායනයට ලක් කරන ලදී. [19] මේ හා සම්බන්ධව, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් සියලු ම මහේස්ත්‍රාත්වරුන්ගේ සහභාගීත්වය අනිවාර්ය කෙරුණු වෙබිනාර් සැසියක් පවත්වා ඇති බවත්, එහිදී මහජන විරෝධතාවලට සහභාගිවීම සම්බන්ධයෙන් අත් අඩංගුවට ගෙන ඔවුන් ඉදිරියට පමුණුවන පුද්ගලයින්ව රිමාන්ඩ් භාරයට පත්කිරීමට නියෝග දීම දිගින්දිගට ම ප්‍රතික්ෂේප කිරීම ඔවුන්ට වෘත්තීය වශයෙන් අවාසිදායක වනු ඇතැයි විනිසුරුවරුන්ට තර්ජනය කළ බවටත් වාර්තා පළ විය.[20] ශ්‍රී ලංකා නීතිඥ සංගමය මෙම වෙබිනාර් සැසිය පිළිබඳ ප්‍රවෘත්තිය හෙලා දකිමින් ඒ පිළිබඳ විමර්ශනයක් පවත්වන ලෙස ඉල්ලා සිටියහ.[21]

## අත් අඩංගුවේදී මියයාම්

2020 වර්ෂයේ සිට 2021 වර්ෂයේ මේ දක්වා කාලය තුළ පොලිස් අත් අඩංගුවේ සිටින අතරතුර සිදුවූ මරණ ගණනාවක් පිළිබඳ මාධ්‍ය වාර්තා පළ විය.

බන්ධනාගාරගතව සිටි සිරකරුවෙකු වූ මෙලන් මාබුල්ල නොහොත් ඌරුජුවා බන්ධනාගාරයෙන් නිදහස් කර දින කිහිපයකට පසුව නවගමුව පොලීසිය විසින් අත් අඩංගුවට ගනු ලැබූ අතර, පසුව වඳුරුමුල්ලේ දී ඔහුව මරාදමන ලදී. පොලීසිය සඳහන් කරන අන්දමට මෙරට නිෂ්පාදිත රෙවොල්වරයක් පොලිස් භාරයට ගැනීම සඳහා සිදුකළ නිල පොලිස් මෙහෙයුමක දී ඔහු පොලීස් නිලධාරීන් වෙත අත්බෝම්බ ප්‍රහාරයක් එල්ල කිරීමට ගිය අවස්ථාවේදී පොලිස් වෙඩිපහරින් ඔහුට මාරක තුවාල සිදුවී තිබේ. [22] ඊට දින කිහිපයකට පසු තාරක විජේසේකර නොහොත් කොස්ගොඩ තාරක ද පොලිස් අත් අඩංගුවේදී මිය ගියේ ඔහුව මීරිගම දක්වා කැඳවාගෙන යන අතරතුර ඇතිවූ එක්තරා "සිදුවීමකදී" පොලීසියට එම "තත්වය පාලනය කිරීම සඳහා බලය පාවිච්චි කිරීමට" සිදුවූ අවස්ථාවේ ය. [23] පොලිස් අත් අඩංගුවේ සිටින අතරතුර ඔහුගේ ජීවිතයට තර්ජනයක් පවතින බව ඔහුගේ පාර්ශ්වයේ නීතිවේදියා විසින් අනතුරු අඟවා තිබියදීත් අත් අඩංගුවේදී සිදුවූ එම මරණය ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් හෙලා දකින ලදී. [24]

තිදරු පියෙකු වූ ඩී. සුනිල් ඉන්ද්‍රජිත් තම පවුලේ අයට (නිවසේ නිරෝධායනය වෙමින් සිටි) ආහාර රැගෙන ඒම සඳහා පිටතට ගිය අවස්ථාවේදී මියගොස් තිබේ. වාර්තාවන අන්දමට, පොලිස් නිලධාරීන් දෙදෙනෙකු ඉන්ද්‍රජිත්ට පහර දෙන මෙන් තවත් පුද්ගලයකුට පවසා තිබේ. ඉන්ද්‍රජිත් මාර්ගයේ ඇදවැටුණු පසු බස් රථයක් ඔහු යටකරගෙන යාම හේතුවෙන් ඔහු මිය ගොස් තිබේ. පොලිස් නිලධාරීන් බලාසිටින අතරතුර සිදුවූ මෙම පහරදීමේ වීඩියෝ දර්ශන සමාජ මාධ්‍යතුළ වේගයෙන් පැතිර ගිය අතර, තම රාජකාරිය පැහැර හැරීම හේතුවෙන් අදාළ පොලිස් නිලධාරීන් දෙදෙනා අත් අඩංගුවට ගෙන ඇති බව වාර්තා වේ. [25]

**පර්යේෂක සහ නාට්‍යරචක (පුරුෂ, අවු. 28, මඩකලපුව)**

*"විවිධ ප්‍රදේශවල විවිධ සිද්ධි සම්බන්ධයෙන් අත් අඩංගුවේ සිටින පුද්ගලයින් අත්අඩංගුවේ දී මියයාම් ගණනාවක් මම දැකලා තියෙනවා. මේක සැකකරුවන් කියලා චූදිත අයට ඉතාම රළු විදිහට සැලකීමක්, ඒවගේම මේක සම්පූර්ණයෙන්ම නීතියට විරුද්ධයි. මෙවැනි සිද්ධි බොහොමයකදී අනුගමන කළ යුතු අධිකරණ කාර්යපටිපාටි රාශියක් තියෙනවා. නමුත් එම කාර්යපටිපාටි සම්පූර්ණ කරන්නේ නැතිව සැකකාරයින්ව මරාදමනවා, මේක නීතියේ ආධිපත්‍යයට සම්පූර්ණයෙන්ම පටහැනියි. ගිය අවුරුද්දේ බන්ධනාගාරයේ සිදුවුනු මරණත් මේ වගේම තමයි. නීතිය හා සාමය හැමදෙනාටම පොදු වෙන්න ඕනැ. නීතියට අනුව ඔවුන් වරදක් කරපු අය වුනත්, ඒකට දඬුවම් දෙන එක හැමකෙනෙකුට ම, නැත්නම් ඕනෑම කෙනෙකුට කරන්න බැහැ."*

නැගෙනහිර පළාතේ එරාවූර් පොලිසිය විසින් අත් අඩංගුවට ගෙන සිටි අතරතුර චන්ද්‍රන් විතූෂන් මිය ගියේ ය. මුල් අවස්ථාවේ දී, විශේෂ අධිකරණ වෛද්‍ය නිලධාරියා විසින් ඔහුගේ මරණයට හේතුව වශයෙන් දක්වා තිබුණේ මෙරට අයිස් යන නමින් හඳුන්වනු ලබන ක්‍රිස්ටල් මෙතැම්ෆෙට මින් අධිමාත්‍රාවක් ශරීරගතවීම යි. [26] ඔහුගේ සිරුරේ දකින්නට ලැබුනු සුළු තුවාල මාරාන්තික ඒවා නොවන බව ද සඳහන් වී තිබුණි. විතූෂන් පොලි ස් අත් අඩංගුවට ගෙන තිබුණේ ඔහුගේ නිවසේ දී වූ අතර, පොලිස් ස්ථානයට ගෙන යෑමට පෙර පොලිසියෙන් ඔහුට දරුණු ලෙස පහර දුන් බව පවුලේ සාමාජිකයෝ කියති. කෙසේ වෙතත්, විතූෂන් ගේ සිරුර නැවතත් ගොඩ ගෙන දෙවන මරණ පරීක්ෂණයක් පවත්වන ලෙසට මඩකලපු මහේස්ත්‍රාත්වරයා නියෝග කර තිබේ. [27]

දෙදරු පියෙක් වූ මොහොමඩ් අලි පානදුර උතුර පොලිසිය භාරයේ සිටියදී මිය ගියේ ය. පොලිස් ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ ජූනි 7 වැනි දා සඳහන් කළේ 42 හැවිරිදි මෙම පුද්ගලයා කලින් දින පානදුර උතුර පොලීසිය ඇඳිරි නීතිය උල්ලංඝනය කරන්නන් සොයා මුර සංචාරය කරන අතරතුර අත් අඩංගුවට ගෙන ඇති බව ය. පොලිස් ස්ථානයට රැගෙන යමින් සිටි අතරතුර සැකකරු වාහනයේ පසුපස දොර විවෘත කර ඉන් එළියට පැන තිබේ. පානදුර උතුර

පොලීසියේ පොලිස් නිලධාරීන් දෙදෙනෙකු මෙම සිදුවීම සම්බන්ධයෙන් වැඩ තහනම් කිරීමට ලක්ව තිබේ.[28]

පැළියගොඩ ගැමුණු මාවතේ පදිංචි, දෙදරු මවක් වන 43 හැවිරිදි කාන්තාවක් පොලිස් අත් අඩංගුවේදී මිය ගියේ දෙපිරිසක් අතර ඇති වූ ගැටුමක් සම්බන්ධයෙන් පැලියගොඩ පොලිසිය විසින් මෙම කාන්තාව ඇතුළු පුද්ගලයින් පස් දෙනෙකු පොලිස් ස්ථානයට කැඳවා ඔවුන් අත් අඩංගුවට ගත් පසුව ය. ඇයගේ සෞඛ්‍ය තත්වය සම්බන්ධයෙන් පොලිසියට දැනුම්දීමෙන් පසුව පවා අවශ්‍ය ප්‍රතිකාර ලබාදීමට ඇයව රෝහලක් වෙත ගෙනයාමට පොලිසිය ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් ඇය මිය ගිය බවට ඇයගේ ඥාතීහු චෝදනා කරති.[29]

මේ අතර, 2017 පෙබරවාරි 25 වැනි දින පැලියගොඩ පොලිසිය විසින් අත් අඩංගුවට ගනු ලැබීමෙන් පසුව පොලිස් පහරදීම් හේතුවෙන් මියගිය ඉහළ බෝමිරිය, කඩුවෙල, පදිංචිකරුවෙකු වූ චාදික් ශ්‍යාමන්ගේ (42) මරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලිසිය රුපියල් මිලියනයක් වන්දි ගෙවිය යුතු බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නියම කරන ලදී.[30] එසේම, කන්දකැටිය පොලීසියේ නිලධාරීන්ගේ පහරදීමක් හේතුවෙන් මියගිය 17 හැවිරිදි සඳුන් මාලිංගගේ මව වෙත ද ශ්‍රේෂ්ඨාධිකරණයෙන් වන්දි පිරිනමන ලදී.[31]

**කුඩා ව්‍යාපාරික සහ සිවිල් සමාජ අංශයේ ක්‍රියාකාරික (කාන්තා, වයස 30, කළුතර)**

*"පොලිස් අත් අඩංගුවේ ඉන්න සැකකරුවන් මියයාමේ සිද්ධි කිහිපය ගැන සහ පොලිස් අත්අඩංගුවේ සිටින පුද්ගලයින්ට එරෙහි සිදුවුණු ප්‍රචණ්ඩත්වය පිළිබඳ මම බොහෝ කනස්සල්ලට පත් වුණා. මේ වගේ සිදුවීම් වළක්වාගන්න ඕනෑ කියලා මම හිතනවා - මොකද, ජීවත්වීමේ අයිතිය හැමදෙනාටම පොදුයි. පොලීසිය හරි ආරක්ෂක බලකා හරි යම් සිද්ධියක සැකකාරයින් විදියට යම් කෙනෙක් අත් අඩංගුවට ගත්තත්, ඒ අය වරදකරුවන් බව ඔප්පු වුනොත් ඒ අයට දඬුවම් දෙන්න නීතිමය ක්‍රියාපටිපාටි ඇතිකරලා තියෙනවා. පොලීසියයි අනෙක් ආරක්ෂක අංශයි ඒ වූදිත සැකකරුවන්ගේ සහ සිරකරුවන්ගේ ආරක්ෂාව ගැනත් වගකියන්න ඕනෑ. 'මේ අය කුඩු විකුණන අය, අපරාධ කාරයෝ, පාතාළ සාමාජිකයෝ' කියලා මහජනතාව මෙවගේ සිදුවීම් පිළිගන්න හුරුවෙලා හිටියත්, නීතිය අනුව කටයුතු කරලා ඒ අය වරදකරුවන් බව ඔප්පු වුනොත් ඒ අයට දඬුවම් දෙන තුරු ඒක එහෙම නෙවෙයි."*

## පොලීසිය විසින් පහරදෙන ලද බවට පැමිණිලි කිරීම්

2020 මැයි මාසයේදී ඇඳිරිනීතිය පවතින අතරතුර අළුත්ගම දර්ගා නගරයේ වීථියක සිට හමුවූ ඔටිසම් සහිත 14 හැවිරිදි පිරිමි දරුවෙකුට පොලීසිය විසින් පහර දී තිබේ. සමාජ මාධ්‍ය තුළ හුවමාරු වූ අදාළ සී.සී.ටී.වී. දර්ශනවලින් පෙන්නුම් කෙරෙන්නේ පොලිස් නිලධාරීන් පිරිසක් අදාළ පිරිමි ළමයාගෙන් ප්‍රශ්න කරන ආකාරයත්, පාර හරහා ඔහුව පොලිස් මුරපොළ වෙත ඇදගෙන යන ආකාරයත්, එහිදී ළමයාට නැවත නැවතත් පහරදෙන අන්දමත්, එම ස්ථානයේ අසල සිටි අය පවා එයට සම්බන්ධ වන අන්දමත් ය. ඉන්පසුව පොලිස් නිලධාරීහු මෙම ළමයාව මුරපොළ පසුපස ඇති ගසක් යට තිබූ කණුවක ගැට ගසති. කෙසේ වෙතත් සිදුවීම පිළිබඳ ආරංචි වී ළමයාගේ පියා එම මුරපොළට පැමිණ එම ළමයා ඔටිසම් සහිත ළමයකු බව ඒත්තු ගැන්වීමෙන් පසුව ඔහුට ළමයාව ගෙදර ගෙනයෑමට අවසර ලැබී තිබේ.[32] පහරදුන් අයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කර තිබේ.[33]

හක්මන ප්‍රදේශයේ පදිංචි තරුණයකුට 2021 ජනවාරි 7වැනි දින හක්මන පොලීසියේ නිලධාරීන් විසින් පහර දී තිබේ. මෙම වින්දිතයා සහ ඥාති සහෝදරයෙකු සමග මත්පැන් පානය කිරීම සඳහා අසල්වාසියෙකු එකතුවීමෙන් පසුව අසල්වාසීන් අතර ඇති වූ ආරවුලක් මෙම සිදුවීමට පාදක වී තිබේ. බහින්බස්වීම සිදුව ඇත්තේ තරුණයින් සහ අසල්වාසියෙකුගේ බිරිඳ අතර ය. ඇය තම සැමියාට මත්පැන් පෙවීම ගැන ඔවුන්ට චෝදනා කර තිබේ. එදින පෙ.ව. 1.00 ට පමණ උප පොලිස් පරීක්ෂක ශාන්ත කරුණාරත්න එම ස්ථානයට පැමිණ වින්දිතයාව අත් අඩංගුවට ගෙන එම ස්ථානයේදීම ඔහුට ලීයෙන් සැදූ උපකරණයකින් පහර දී, ආපසු පොලිස් ස්ථානයට ගිය පසු තවත් පොලිස් නිලධාරීන් ද

සමග එක්ව පහර දී තිබේ. පසුව ඔහුව රෝහලකට රැගෙන ගොස් ඇති අතර පහරදීම පිළිබඳව වෛද්‍යවරයාට නොපවසන මෙන් ඔහුට තර්ජනය කර තිබේ. ආපසු පොලිස් ස්ථානයට පැමිණි පසු ඔහුට තවදුරටත් කොසු මිටකින් පහර දී තිබේ. මූත්‍රා සමග ලේ පිටවීම ඇතුළුව, පහරදීම්වල ප්‍රතිඵලයක් ලෙස ඇතිවූ තුවාල විශාල සංඛ්‍යාවක් සම්බන්ධයෙන් ඔහු පැමිණිලි කර තිබේ. මහේස්ත්‍රාත්වරයා ඉදිරියට පැමිණවූ විට පොලීසිය අතින් තමන්ට විඳින්නට වූ පහරදීම් සහ තුවාළ සම්බන්ධයෙන් වින්දිතයා අධිකරණයට දැනුම් දී තිබේ. මහේස්ත්‍රාත්වරයා අධිකරණයේ පිස්කල් හරහා අලුතින් වෛද්‍ය පරික්ෂණයක් සිදුකිරීමට නියෝග දී ඔහුට ඇප ලබාදී තිබේ.[34]

**පර්යේෂක සහ නාට්‍යවේදී (පුරුෂ, අවු. 28, මඩකලපුව)**

*"මේ ගම්බද ප්‍රදේශවලත් සී.අයි.ඩී., බුද්ධි අංශ නියෝජිතයෝ වගේ සැඟවුනු ඔත්තුකරුවෝ බොහෝ දෙනෙක් ඉන්නවා. මිනිස්සු එළියට ගියාම ඔවුන් ගුටිබැටදීම්වලට ලක්වුණු සිද්ධි වගයකුත් වාර්තා වෙලා තිබුණා. ඒක නීති ක්‍රියාත්මක කරන කුරිරු ක්‍රමයක්. ඒ වගේම, ඒක යුද්දෙන් පසු කාලයේ උතුරේත් නැගෙනහිරත් බහුලව ක්‍රියාත්මක වුණු ක්‍රමයක්. ආරක්ෂක හමුදාවල බහුතරයක් සිංහල වුනත්, ආරක්ෂක හමුදාවලට සම්බන්ධ දෙමළ සහ මුස්ලිම් අයත් බොහෝ දෙනෙක් ඉන්නවා. ඒ අය යොදාගන්න ක්‍රමයත් මෙයට සමානයි. නිරෝධායන නීතිය උල්ලංඝනය කිරීම හේතුවෙන් ආරක්ෂක හමුදාවල බලකිරීම මත දණ ගසන්නට සිදුවූ මුස්ලිම් පිරිමින් සම්බන්ධ එරාවූර් සිද්ධියේදී මෙය විශේෂයෙන් ම පැහැදිලි වුණා. පවතින වසංගත තත්වය තුළ නිරෝධායන නීති පවත්වාගෙන යන එක වැදගත්. නමුත් ඒක කරන නිවැරදි ක්‍රමයක් තියෙනවා. මහජනතාවගේ නාමයෙන් මේ විදිහට නීතිය පාවිච්චි කිරීම ඒ සඳහා තියෙන නිවැරදි ක්‍රමය නොවෙයි."*

නීති විද්‍යාලයේ අවසාන වසරේ ශිෂ්‍යයෙකු සහ හිටපු පළාත් ආණ්ඩුකාරවරයෙකුගේ පුතෙකු වන තරුණයෙකුට 2021 පෙබරවාරි 25 වැනි දින පෑළියගොඩ පොලීසියේදී පහර දී තිබේ. වින්දිතයාගේ නීති නියෝජිතයින්ට අනුව, ඔහුට පහර දී ඇත්තේ නීතිඥයෙකු වන තම සහෝදරයාගේ සේවාදායකයෙකුට කෑම පාර්සලයක් ගෙනැවිත්දීම සඳහා ඔහු පොලිස් ස්ථානයට ගිය අවස්ථාවකදී ය. ඔහු තමන් නීතිඥයකු බව ප්‍රකාශ කළේ යැයි චූදිත පොලිස් නිලධාරීහු පවසති. ශ්‍රී ලංකා නීතිඥ සංගමය නොපමාව මෙම සිදුවීමට ප්‍රතිචාර දක්වමින් ඒ පිළිබඳ විමර්ශනය කර නඩුපැවරීම් සිදුකළ යුතු බව කියා සිටියේය. දින කිහිපයක් තුළ පොලිස් නිලධාරීන් සිව් දෙනෙකුගේ වැඩ තහනම් කරන ලදී.[35]

පොලීසියෙන් අත් අඩංගුවට ගෙන ගල්කිස්ස මහේස්ත්‍රාත් වෙත පමුණුවන ලද පුද්ගලයෙකු නිදහස් කරනු ලැබීමෙන් පසුව මියගොස් තිබේ. ඔහු කළුබෝවිල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු විය. වෘත්තියෙන් යතුරුපැදි අළුත්වැඩියා කරන්නෙකු වූ මොහු 2021 මාර්තු මාසයේ දිනකදී තම යතුරුපැදියේ නැගී තමන්ගේ පුතා වැඩ කරන ස්ථානයට ඔහුගේ දිවා ආහාරය රැගෙන යමින් සිටියදී රත්මලාන ප්‍රදේශයේ දී පොලීසිය විසින් ඔහුව අත් අඩංගුවට ගෙන ඇත. තමන්ගේ හොර බඩු සඟවා ඇත්තේ කොහේ දැයි නිලධාරීන් ඔහුගෙන් ප්‍රශ්න කරන විට, තම නිවසේ කිසිවෙකු තමන් අත් අඩංගුවට පත් වී ඇති බවක් නොදන්නා බව දන්නා මෙම වින්දිතයා පොලිස් නිලධාරීන් තමාව තම නිවස ආසන්නයට ගෙනයෑමට යොමුකර ගැනීම සඳහා හොර බඩු සඟවා ඇත්තේ තම නිවස ආසන්නේ බවට බොරු කියා තිබේ. එහි ගිය පසුව ද හොර බඩු ඇති තැන පෙන්වන ලෙස පවසමින් නිලධාරීන් ඔහුට දිගටම පහර දී ඇති අතර, ඔහුගේ පවුලේ සාමාජිකයින් මෙය දැක තිබේ. ඔහුගේ බිරිඳ පවසන අන්දමට, ඔහුගේ උපාය අවබෝධ වූ පසු ආපසු පොලිස් ස්ථානයට රැගෙන ගිය විට ද ඔහුට එහිදී තවත් පහර දී තිබේ. මාර්තු 19 වැනි දින ඔහු මහේස්ත්‍රාත්වරයා ඉදිරියට පමුණුවා ඇති අතර, එහිදී ඔහු කංසා ග්‍රෑම් 50 ක් ළඟ තබාගැනීමේ වරදට තමන් වරදකරු යැයි පිළිගෙන තිබේ. දඩ මුදලක් ගෙවීමෙන් පසු ඔහුට නිවසට යාමට අවසර ලැබුණු නමුත් පහරදීම් හේතුවෙන් ඔහු දිගටම රෝගාතුර තත්වයෙන් පසුවී තිබේ. ඔහු පවුලේ අය සමග පවසා ඇති පරිදි, ඔහුව බංකුවකට තබා බැඳ නාසයෙන් බටයක් ඇතුළු කර ඒ හරහා ජලය වත්කර තිබේ. පසුව ඔවුන් පෙට්‍රල් වත්කර තිබේ. ඔහුගේ සිරුරේ ද බොහෝ තැලුම් තුවාළ ලකුණු තිබුණි. ඔහුගේ තත්වය උග්‍රවූ බැවින් ඔහුගේ බිරිඳ මාර්තු 21 වැනි දින ඔහුව රෝහලට ඇතුළත් කර

තිබේ. එහිදී දින ඔහුට පහක් තිස්සේ ප්‍රතිකාර කිරීමෙන් පසු රෝහලෙන් මුදා හැර තිබේ. නමුත් ඔහු එතැන් පටන් කිසිවිටෙක යථා තත්වයට පත් වී නැත. මාර්තු 31 වැනි දින නැවතත් ඔහුව රෝහල්ගත කර ඇති අතර, ඉන් පසු දිනයේ ඔහු මියගොස් තිබේ. මරණයට හේතුව ලෙස දක්වා තිබුණේ නිවුමෝනියා තත්වයයි. නමුත් ඔහුගේ පවුලේ අයගේ ඉල්ලීම මත පශ්චාත් මරණ පරීක්ෂණයක් පැවැත්වීමට නියෝග කර තිබේ. පොලිස් මාධ්‍ය ප්‍රකාශක, නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ පවසන අන්දමට, පොලීසියේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයෙකු ඔහුගේ මරණය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වමින් සිටියි.[36]

2021 මාර්තු මස 29 වැනි දින පන්නිපිටියේ දී සිද්ධියක් සිදුවී ඇති අතර, එහිදී ලොරි රථ රියැදුරකුට පහර දෙන පොලිස් නිලධාරියෙකුගේ දර්ශන වීඩියෝපටවල සටහන් වී තිබේ. එම වීඩියෝපටවල දකින්නට ලැබෙන අන්දමට පොලිස් නිලධාරියා එම පුද්ගලයා බිමට ඇද දමා ඔහුගේ ඇඟ මතට පනියි. එම වීඩියෝපටය ශීඝ්‍රයෙන් සමාජමාධ්‍ය තුළ පැතිර ගියේ ය. වාර්තාවලට අනුව, එම රියැදුරාගේ ලොරි රථය වැරදීමකින් නිලධාරියාගේ ඇඟේ වැදී ඇති අතර, එය නිලධාරියාව අධික ලෙස ප්‍රකෝප කරවීමට හේතු වී තිබේ.[37]

ඖෂධ මිලට ගැනීමට ඖෂධහලකට ගිය පුද්ගලයෙකු 2021 මැයි 9 වැනි දින යක්කලමුල්ල පොලීසිය විසින් පහරදීමට සහ අත් අඩංගුවට ගැනීමට ලක්වී තිබේ. මෙම සිදුවීම සිදුවී තිබෙන්නේ නාඳුනන පිරිසක් විසින් යක්කලමුල්ල පොලිස් ස්ථානය ආසන්නයේ පිහිටි යක්කලමුල්ල මංසන්ධියේ දී මල්වෙඩි පත්තු කිරීමත් සමගිනි. මේ වනවිට ඖෂධහල තුළ සිටි වින්දිතයා ශබ්දය ඇසී වසංගතය අතරේ මල්වෙඩි දල්වන්නේ කවුදැයි බැලීමට කුතුහලයෙන් ඉන් එළියට පැමිණ තිබේ. ඔහු බලා සිටින අතරේ නිලධාරීන් කිහිපදෙනෙකු මේ කලබලය පරීක්ෂා කර බැලීමට පොලිස් ස්ථානයෙන් පිටතට පැමිණ ඇති අතර, නිල ඇඳුමින් සැරසී සිට ඇත්තේ ඉන් එක් අයෙක් පමණි. ඉන් පසු ඔවුන් එම ස්ථානය පසු කර යමින් සිටි පාපැදිකරුවෙකුට පහර දී තිබේ. වැඩි වේලාවක් යාමට පෙර, එක් නිලධාරියකු ඖෂධහලේ සිට බලා සිටි මෙම වින්දිතයා සිටින ස්ථානයට පමිණ මල්වෙඩි දැල්වූයේ ඔහු දැයි විමසමින් ඔහුට පහර දෙන්නට පටන් ගෙන තිබේ. ඖෂධහලේ හිමිකරු ඔහු පැමිණියේ බෙහෙත් මිලදී ගැනීමට බව කියමින් ඔහුව බේරාගැනීමට උත්සාහ කර ඇතත්, නිලධාරියා ඊට සවන් දී නොමත. ඔහු වින්දිතයාව අත් අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට ගෙන ගොස් ඇති අතර, එහිදී ද වින්දිතයාට තවත් පහර දී තිබේ. ඖෂධහල් හිමියා තවත් මිතුරෙකු සමග වින්දිතයාව බැලීමට පොලීසියට පැමිණිය ද පොලීසිය ඔහුට එයට ඉඩ දී නැත. ඊට පැය භාගයකට පමණ පසු ඖෂධහල් හිමියා තම පරිශ්‍රයේ සවිකර තිබූ සී.සී.ටී.වී. කැමරාවල දර්ශන ඔහුගේ දුරකථනයේ ගබඩා කර ගෙන නැවතත් පොලීසියට පැමිණ එම දර්ශන වැඩ බලන ස්ථානභාර නිලධාරියාට පෙන්වා වින්දිතයා නිදහස් කරන මෙන් ඉල්ලා තිබේ. එම දර්ශන නැරඹූ පසු එම නිලධාරියා පසුදින උදෑසන (දර්ශන පෙන්වා පැය 12කට ආසන්න කාලයකට පසුව) එම අත් අඩංගුවට ගැනීම සුළු අත් වැරදීමක් බව පවසමින් වින්දිතයා නිදහස් කර තිබේ. මේ වනවිට වින්දිතයා මෙම පහරදීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසමට පැමිණිලි කර තිබේ. පහරදීමෙන් පසුව ඔහුට දින දෙකක් කරාපිටිය රෝහලේ ප්‍රතිකාර ගැනීමට සිදුව තිබේ.[38]

හම්බන්තොට, බල්ලගස්වැව ප්‍රදේශයේ පදිංචි දෙදරු පියෙක් ජූනි මාසයේ දිනක පහරදීමට ලක් වී තිබේ. මෙම පහරදීම සිදුවී ඇත්තේ ඔහුට එරෙහිව කර තිබූ පැමිණිල්ලක් සම්බන්ධයෙන් කරුණු දැක්වීමට ඔහු පොලීසිය වෙත ඉදිරිපත් වූ අවස්ථාවේ ය. පැමිණිලිකාර කාන්තාව එහි පැමිණි ඔහුව එහි සිටි උප පොලිස් පරීක්ෂකවරයෙකුට පෙන්වා ඇති අතර එම නිලධාරියා ඔහුට කම්මුල් පහරක් එල්ල කර තිබේ. පසුව, වින්දිතයාට අසුන්ගන්නට සලස්වා නිලධාරියා ඔහුගේ හිසට, මුහුණට හා සිරුරට පහර දී ඔහුව සිර මැදිරියකට දමා තිබේ. එහිදී එදින රාත්‍රියේ සහ ඉන් පසු දින පොලිස් නිලධාරීන් ඔහුට පහරදී තිබේ.[39]

පැමිණිල්ලක් කිරීමට තම සැමියා සමග පාදුක්ක පොලීසියට ගිය තරුණ මවක් චෝදනා කරන්නේ තමන්ට නිලධාරීන් ලිංගික හිරිහැර සිදුකළ බවත්, කිසිදු හේතුවක් නොමැතිව තම සැමියාව පොලිස්

ස්ථානයේ සිර කළ බවත්  ය. මේ වනවිට ඇය මෙම සිදුවීම පිළිබඳව පොලිස්පතිවරයා වෙත පැමිණිලි කර තිබේ.[40]

2021 ජූලි 5 වැනි දින මිරිජ්ජවිල තාක්ෂණික පුහුණු පාසලේ පැවති ශ්‍රමදානයක සිට ආපසු නිවසට යමින් සිටි තරුණයින් දෙදෙනෙකුට බීමත් පොලිස් නිලධාරියෙකු විසින් පහර දී තිබේ. ඔවුන් පාගමනින් තම නිවසට යමින් සිටියදී මෙම පොලිස් නිලධාරියා යතුරුපැදියකින් පැමිණ ඔවුන්ව නවතා කෝවිඩ් වැලැක්වීමට පැළඳ සිටි මුහුණු ආවරණ ගලවන මෙන් ඔවුන්ට පවසා තිබේ. ඔවුන් එසේ කිරීම ප්‍රතික්ෂේප කළ විට, ඒ අවස්ථාවේ සිවිල් ඇඳුමින් සිටි, සහ පසුව හම්බන්තොට වරාය පොලිසියට අනුයුක්තව සේවය කරන බවක් හඳුනාගත් මෙම පොලිස් නිලධාරියා ඔවුන්ට පහර දී තිබේ.[41]

2021 අගෝස්තු මාසයේ දී කොටවිල ප්‍රදේශයේ පුද්ගලයෙකු කොටවිල පොලීසියේ පොලිස් නිලධාරීන්ගේ පහරදීමට ලක් වී තිබේ. මෙම වින්දිතයාගේ අසල්වැසියෙකු තම පුතාට "ගල්වලින් ගසන ලදැයි" වින්දිතයාට එරෙහිව චෝදනා කර ඇත. පොලීසියෙන් ඔහුව කැඳවනු ලැබීමෙන් පසු වින්දිතයා අගෝස්තු 3 වැනිදා තමන්ට එරෙහි චෝදනාවලට මුහුණදීම සඳහා පොලිස් ස්ථානයට ගොස් තිබේ. එහි ගිය විට පොලිස් නිලධාරීන් තමන්ට පහර දුන් බව ඔහු පවසන අතර, ඔහුගේ බිරිඳ එයට සාක්ෂි දරයි. පොලීසියෙන් මුදාහැරි පසු ඔහු මාතර රෝහලට ඇතුළත් වී ප්‍රතිකාර ලබාගෙන තිබේ.[42]

## ක්‍රියාවලිය අවභාවිතා කිරීම්

2020 අප්‍රේල් මාසයේ දී රට අගුළු දමා තිබෙන අතරතුර නීතිවේදී හෙජාස් හිස්බුල්ලා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගන්නා ලදී. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අනුව, ආරක්ෂක අමාත්‍යවරයා එවැනි රඳවා තැබීමක් සඳහා අවසර ලබා දිය යුතු වුවත් අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව හිස්බුල්ලාගේ නිවසට පැමිණ ඔහුව රැගෙන යන අවස්ථාව වනවිට ආරක්ෂක අමාත්‍යවරයෙකු පත් කර නොතිබුණි. ඔහුට එරෙහිව ඇති චෝදනා මොනවා දැයි ඔහුට දැනුම් නොදුන් නමුත්, පෙර අවස්ථාවලදී ඔහු 2019 පාස්කු ඉරුදින ප්‍රහාරයට වගකිව යුතු ඇතැම් පුද්ගලයින්ගේ පියාව නියෝජනය කර ඇති බව නිලධාරීන් විසින් මහජනතාවට දැනුම්දී තිබේ. අදටත් ඔහු රැඳවුම්භාරයේ පසු වෙයි.[43]

ආනාෆ් ජසීම් යනු මන්නාරම ප්‍රදේශයේ පදිංචි පුද්ගලික පන්ති ගුරුවරයෙකු වන අතර, 2020 වර්ෂයේ දී ඔහුව ද අත් අඩංගුවට ගනු ලැබුවේ 2019 පාස්කු ඉරුදින ප්‍රහාර සඳහා ඔහුට ඇතැයි කියන තහවුරු නොවූ සම්බන්ධතා පදනම් කරගෙන වේ. ඔහුව අත් අඩංගුවට ගනු ලැබුවේ ඔහු විසින් පළ කරන ලද කවි පොතක් හෙජාස් හිස්බුල්ලාට සම්බන්ධ, ප්‍රදේශයේ ළමයින්ට පුණ්‍යාධාර මත පවත්වාගෙන යන පාසලක් සඳහා භාවිතා කළ දේපළක තිබී හමුවීමෙන් පසුව ය. එම ස්ථානය වැටලූ නිලධාරීන්ට එහි තිබී හමු වූ, සම්පූර්ණයෙන්ම දෙමළ භාෂාවෙන් තිබූ එම කවි පොත කියවීමට හෝ අවබෝධ කරගැනීමට නොහැකි වුවත්, ඔවුන් ආනාෆ් ජසීම්ව අත් අඩංගුවට ගෙන තිබේ. ඔහුව අත් අඩංගුවට ගැනීමෙන් පසුව, බලධාරීන් මෙම පොත පරිවර්තනය කරවා ගෙන, ළමා මනෝවිද්‍යාඥයින් පිරිසක් මාර්ගයෙන් ඒ පිළිබඳ ඇගයීමක් කර තිබේ. ඔවුන් මෙම පොත "ප්‍රචණ්ඩත්වයට පොළඹවන, ලිංගික හැඟීම් අවුස්සන, සියදිවි හානි කරගැනීම ප්‍රවර්ධනය කරන, මරණය ගෞරව සම්මානයට ලක් කරන, ලොව වටා මුස්ලිම්වරුන්ට සිදුවූවා යැයි කියන අසාධාරණකම් ගැන කථා කරන සහ ඇතැම් කවි වල ප්‍රචණ්ඩත්වය සිදු කළ වරදකරුවන්ට එරෙහිව වෛරය අවුළුවාලන" ග්‍රන්ථයක් යැයි ප්‍රකාශ කර තිබේ. කෙසේ වෙතත්, ප්‍රමුඛ පෙළේ කලාකරුවන් සහ දෙමළ භාෂාව තම මවුබස වන අය එම සොයා ගැනීම්වලට පටහැනි අදහස් දක්වමින් මෙම පොත මගින් අවිහිංසාව ප්‍රවර්ධනය කරන බව පවසති.[44]

## සමාප්තිය

ලොව අන් බොහෝ ස්ථානවල මෙන්ම ශ්‍රී ලාංකික සමාජයේ ද පවතින විවිධ ඉරිතැලීම්, විශේෂයෙන්ම දශක ගණනාවක් තිස්සේ පැවති ආර්ථික විසමතා මෙම වසංගතය මගින් නිරාවරණය කර තිබේ. එවැනි අසමානතා දුගී ජනතාව මත වඩාත් ඉහළ අවදානම්සහගත භාවයක් ඇතිකරවන අතර, මෙම ලිපිය මගින් ද ඇතැම් විට පෙන්නුම් කෙරෙන පරිදි පුද්ගලික නිදහස මත වසංගතය මගින් ඇතිකෙරෙන බලපෑම ද එම වින්දිතයින්ගේ සමාජ ආර්ථික තත්වයන්හි බලපෑමට ලක් වී තිබේ. ඉදිරි මාසවලදී, නැතහොත් ඉදිරි වර්ෂවලදී ලොව පුරා රටවල රජයයන් වසංගතය සඳහා තමන් දක්වන ප්‍රතිචාරය අඛණ්ඩව පවත්වාගෙන යාමේදී මෙම අසමානතා හඳුනාගත යුතු වේ. රජයේ බලපුළුවන්කාරකම අවධාරණය කෙරෙන ප්‍රවේශයන් මේ සඳහා යොදාගැනීම අසාර්ථක වනවා පමණක් නොව, නව කොරෝනා වෛරසයට වඩා වැඩි කාලයක් පවතින කැළැල් සමාජයේ ඉතිරිකර යාමට ද එය හේතු වනු ඇත. දැනට කරගෙන යන බලපුළුවන්කාරකම් විදහා පෑම අතහැර දමා, ඒ වෙනුවට, බලපෑමට ලක් වූ ප්‍රජාවන් සමග ගොඩනගා ගන්නා ශක්තිමත් සම්බන්ධතා, පුරවැසියන්ගේ සහයෝගිතාවය දිරිමත් කෙරෙන ධනාත්මක සන්නිවේදනය, සමාජයේ වහාම බලපෑමට ලක් වන සියලුම කොටස්වලට ප්‍රමාණවත් සහන ලබාදීම සහ විශේෂඥ උපදෙස් අනුව ගන්නා තීරණ මත විශ්වාසය තබමින් ශ්‍රී ලංකා රජය මෙම ආදර්ශය ලොවට ලබා දිය යුතු වේ.

# ආශ්‍රේය ග්‍රන්ථ හා ලිපි

1. රජය කෝවිඩ්-19 වැළැක්වීම සඳහා වන ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානය ස්ථාපනය කරයි Daily FT [අන්තර්ජාල]. 2020 මාර්තු 18. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: https://www.ft.lk/News/Govt-launches-National-Ops-Centre-to-counter-COVID-19/56-697707
2. ආසාදිතයින් සංඛ්‍යාව ඉහළ යද්දී ශ්‍රී ලංකාව අගුළු දැමීමක ස්වරූපයේ කොරෝනා වෛරස් ඇ ඳිරිනීතියක් පනවයි, වෙළඳපොළ අස්ථාවර වෙයයි, EconomyNext [අන්තර්ජාල]. 2020 මාර්තු 20. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: https://economynext.com/sri-lanka-in-lockdown-style-coronavirus-curfew-as-count-moves-up-markets-wobble-60503 /

3. පොලීසය ඇඳිරිනීතිය උල්ලංඝනය කළ තවත් 809 දෙනෙක් අල්ලා ගනියි. Daily FT[අන්තර්ජාල]. 2020 මාර්තු 20. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: https://www.ft.lk/BREAKING-NEWS/Police-net-809-more-curfew-violators/10526-698240

4. එම.

5. ඇඳිරිනීතිය උල්ලංඝනය කළ 34,500 අත්අඩංගුවට ගනියි. අද දෙරණ [අන්තර්ජාල]. 2020 අප්‍රේල් 21. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: http://www.adaderana.lk/news/62869/34500-curfew-violators-arrested

6. "නිරෝධායන ඇඳිරිනීතිය" උල්ලංඝනය කරන්නන්ට මාස 06 ක සිරදඬුවම් ලබා දිය හැකියි: නියෝජ්‍ය පොලිස්පති. News 1st [අන්තර්ජාල]. 2020 අප්‍රේල් 23. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: https://www.newsfirst.lk/2020/04/23/violating-quarantine-curfew-will-lead-to-06-months-in-prison-dig

7. බන්ධනාගාර තුළ කෝවිඩ්-19 පැතිරීම වැළැක්වීම පිණිස සිරකරුවන් නිදහස් පිළිබඳ ලිපිය ජනපතිට යවයි. Daily FT [අන්තර්ජාල], 2020 මාර්තු 26. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: https://www.ft.lk/breaking_news/Letter-sent-to-President-on-release-of-prisoners-to-prevent-spread-of-COVID-19-in-prisons/10526-698065

8. කෝවිඩ්-19 බිය හේතුවෙන් 3,000 ට ආසන්න සිරකරුවන් සංඛ්‍යාවක් නිදහස් කරයි. Daily FT [අන්තර්ජාල]. 2021 අප්‍රේල් 5. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: https://www.ft.lk/breaking_news/Nearly-3000-prisoners-released-over-COVID-19-fears/10526-698516

9. බන්ධනාගාර තුළ කෝවිඩ්-19 පැතිරීම වැළැක්වීම පිණිස සිරකරුවන් නිදහස් පිළිබඳ ලිපිය ජනපතිට යවයි. Daily FT [අන්තර්ජාල], 2020 මාර්තු 26. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: https://www.ft.lk/breaking_news/Letter-sent-to-President-on-release-of-prisoners-to-prevent-spread-of-COVID-19-in-prisons/10526-698065

10. කෝවිඩ්-19 බිය හේතුවෙන් 3,000 ට ආසන්න සිරකරුවන් සංඛ්‍යාවක් නිදහස් කරයි. Daily FT [අන්තර්ජාල]. 2021 අප්‍රේල් 5. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: https://www.ft.lk/breaking_news/Nearly-3000-prisoners-released-over-COVID-19-fears/10526-698516

11. ඇඳිරිනීතිය නීති විරෝධී බවට සුමන්තිරන් තර්ක කරයි, රාමනායකව ඇපමත නිදහස් කර ගනියි. Colombo Telegraph [අන්තර්ජාල].2020 අප්‍රේල් 20. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: https://www.colombotelegraph.com/index.php/sumanthiran-argues-curfew-illegal-gets-ramanayake-released-on-bail /

12. එම.

13. කෝවිඩ්-19 රෝග ලක්ෂණ සඟවාගෙන සිටීමට උපකාර කරන අයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග. News 1st [අන්තර්ජාල]. 2020 අප්‍රේල් 11. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: https://www.newsfirst.lk/2020/04/11/legal-action-against-those-who-aid-to-conceal-covid-19-symptoms/

14. අන්තර්ජාලය ඔස්සේ සිදු කෙරෙන ව්‍යාජ ප්‍රවෘත්ති පළකිරීම සහ ද්වේෂ සහගත ප්‍රහාරයන්ට එරෙහිව පොලිසිය දැඩි පියවර ගැනීමට යයි. Daily FT [අන්තර්ජාල]. 2020 අප්‍රේල් 1. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: https://www.ft.lk/news/Police-to-take-strict-action-against-online-fake-news-and-malicious-attacks/56-698401

15. පොලීසියට එරෙහිව NSP නීතිමය පියවර ගැනීමට යයි. Daily FT [අන්තර්ජාල]. 2020 12. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: https://www.ft.lk/News/NSP-to-take-legal-action-against-Police/56-701528

16. තොණ්ඩමන්ගේ දේහයට ගෞරව දැක්වීම සඳහා හෙට පාර්ලිමේන්තු සංකීර්ණයට රැගෙන එයි. EconomyNext [අන්තර්ජාල]. 2020 මැයි 27. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: https://economynext.com/thondamans-remains-to-lie-in-state-in-parliament-tomorrow-70397/

17 බලන්න, උදා., කොවිඩ් සංහාරය, අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම් සහ පාලන තන්ත්‍රයේ වගකීම. Daily FT [අන්තර්ජාල]. 2020 අගෝස්තු 12. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: https://www.ft.lk/opinion/COVID-carnage-arbitrary-arrests-and-regime-responsibility/14-721608

18. චන්දිමාල් ජයසිංහ සහ පියුමි හංසමාලි අත්අඩංගුවට. අද දෙරණ [අන්තර්ජාල]. 2021 මැයි 31. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: daderana.lk/news/74273/chandimal-jayasinghe-and-piumi-hansamali-arrested

19. විරෝධතාකරුවන්ට එරෙහිව පොලිස් ක්‍රියාමාර්ග: වෘත්තීය සමිති කනස්සල්ල පළ කරති, තමන් අනුමැතිය ලබා දුන් බව මහජන පරීක්ෂකවරු ප්‍රතික්ෂේප කරති. මුද්‍රිත සංස්කරණය - The Sunday Times. 2021 ජුලි 11. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: https://www.sundaytimes.lk/210711/news/police-action-against-protestors-unions-express-concern-phis-deny-they-gave-approval-449049.html

20. විනිසුරුවන්ගේ වෙබිනාර් වැඩසටහන: කනස්සලු වර්ධනය වෙයි. News 1st [අන්තර්ජාල]. 2021 අගෝස්තු 17. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: https://www.newsfirst.lk/2021/08/17/judges-webinar-concerns-grow /

21. විනිසුරුවන් සඳහා වන කොවිඩ්-19 වෙබිනාර් වැඩසටහන පිළිබඳව ශ්‍රී ලංකාවේ විපක්ෂය, නීතිඥ සංගමය දැඩි කනස්සල්ල පළ කරති. EconomyNext [අන්තර්ජාල]. 2021 අගෝස්තු 17. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: https://economynext.com/sri-lanka-opposition-bar-express-deep-concern-over-covid-19-webinar-for-judges-85067 /

22. ශ්‍රී ලංකාවේ නිදහස් කළ රිමාන්ඩ් සිරකරුවෙකු පැහැරගෙන ගොස් ඝාතනය කරයි. SLCAT [අන්තර්ජාල]. 2021 මැයි 12. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: https://www.slcat.org/released-remand-prisoner-abducted-and-assassinated-in-sri-lanka/; තවදුරටත් කියවන්න - පොලිස් වෙඩි පහරින් පාතාල නායක 'උරුජුවා' මිය යයි; ඔහු මිනීමැරුම් සහ කප්පම් ගැනීම් සඳහා අවශ්‍යව සිටි අයෙකි. News 1st [අන්තර්ජාල]. 2021 මැයි 12. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: https://www.newsfirst.lk/2021/05/12/underworld-leader-urujuwa-killed-by-police-fire-he-was-wanted-for-murder-extortion /

23. අපරාධ කල්ලි නායක කොස්ගොඩ තාරක පොලිස් වෙඩි පහරින් මිය යයි. News 1st [අන්තර්ජාල] 2021 මැයි 13. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය https://www.newsfirst.lk/2021/05/13/criminal-leader-kosgoda-tharaka-killed-by-police-fire/

24. ඌරුජුවා සහ කොස්ගොඩ තාරක ඝාතනය පිළිබඳව ස්වාධීන හා අපක්ෂපාතී පරීක්ෂණයක් සිදු කරන ලෙස ශ්‍රී ලංකා නීතිඥ සංගමය ඉල්ලා සිටියි. The Island [අන්තර්ජාල]. 2021 මැයි 16. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: https://island.lk/basl-calls-for-independent-and-impartial-probe-into-killing-of-uru-juwa-kosgoda-tharaka /

25. තම පවුලට ආහාර සෙවීමට ගිය මිනිසෙකුට පහර දී ඝාතනය කර ඇත - බැසිල් ප්‍රනාන්දු. - SLCAT [අන්තර්ජාල].2021 මැයි 30. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය https://www.slcat.org/a-man-who-went-in-search-for-food-for-his-family-beaten-and-killed-basil-fernando / ; වැලිගම වරාය සේවකයාගේ මරණය අභිරහසක්. SLCAT [අන්තර්ජාල]. 2021 මැයි 28

26. මඩකලපුවේදී පොලිස් අත්අඩංගුවේ සිටි සැකකරුවෙකු මියයයි. SLCAT [අන්තර්ජාල]. 2021 ජූනි 4. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: https://www.slcat.org/a-suspect-has-died-in-police-custody-in-batticaloa /

27. ශ්‍රී ලංකාවේ පොලිස් අත්අඩංගුවේදී මිය යාම: දෙමළ තරුණයාගේ මළ සිරුර ගොඩ ගැනේ. JDS [අන්තර්ජාල]. 2021 මැයි 20. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: http://www.jdslanka.org/index.php/news-features/human-rights/1029-death-in-sri-lankas-police-custody-tamil-youths-body-to-be-exhumed

28. සැකකරුවෙක් ජීප් රථයෙන් පැන මිය යාමෙන් පසු ශ්‍රී ලංකා පොලීසියේ පොලිස් නිලධාරීන් දෙදෙනෙකුගේ වැඩ තහනම් කර තිබේ. EconomyNext [අන්තර්ජාල]. 2021 ජූනි 7. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: https://economynext.com/two-sri-lanka-police-officers-interdicted-after-suspect-jumps-off-jeep-to-death-82729 /

29. පැලියගොඩ පොලිස් ස්ථානයේදී තවත් මරණයක්! SLCAT [අන්තර්ජාල] 2021 ජූලි 17. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: https://www.slcat.org/another-death-at-peliyagoda-police-station /

30. පොලිස් පහර දීමෙන් මියගිය ෂර්මන්ට රුපියල් මිලියනයක වන්දියක්! -SLCAT [අන්තර්ජාල]. 2021 ජූලි 15. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: https://www.slcat.org/one-million-rupees-compensation-for-sherman-who-died-of-police-assault/?utm_source=rss&utm_medium=rss&utm_campaign=one-million-rupees-compensation-for-sherman-who-died-of-police-assault

31. කන්දකැටිය තීන්දුව සහ රජයේ අත්අඩංගුවේ සිටයදී අඛණ්ඩව සිදු වන මරණ - රුකී ප්‍රනාන්දු. SLCAT [අන්තර්ජාල]. 2021 ජූලි 2. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: https://www.slcat.org/kandaketiya-judgement-and-continuing-deaths-in-state-custody-ruki-fernando /

32. ඔටිසම් රෝගී පිරිමි ළමයාට පොලිසිය විසින් පහර දීම පිළිබඳ පරීක්ෂණ ආරම්භ කර ඇත. Colombo Gazette [අන්තර්ජාල]. 2020 ජූනි 4. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය : https://colombogazette.com/2020/06/04/probe-launched-into-assault-on-autistic-boy-by-police /

33. හිංසාවට ලක් කළ ඔටිසම් රෝගී පිරිමි ළමයාගේ මානව හිමිකම් පෙත්මස විභාග කිරීමට අවසර. SLCAT [අන්තර්ජාල]. 2021 අප්‍රේල් 2. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: https://www.slcat.org/human-rights-petition-for-tortured-autistic-boy-granted-leave-to-proceed /

34. පොලිස් වදහිංසාවට තවත් උදාහරණයක්! - slcat (n.d.)

35. නීති ශිෂ්‍යයාට පහර දීම: පොලිසියේ සාහසිකත්වය නොඉවසන්නැයි ශ්‍රී ලංකා නීතිඥ සංගමය ඉල්ලයි. ය. The Sunday Times [අන්තර්ජාල]. 2021 පෙබරවාරි 28. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: https://www.sundaytimes.lk/210228/news/attack-on-law-student-basl-wants-zero-tolerance-for-police-brutality-434127.html

36. ගල්කිස්සේ මිය ගිය සැකකරුට නියුමෝනියාව හැදුනේ පොලිස් වධහිංසා වලින්ද? - aithiya (2.4.2021)

37. ශ්‍රී ලාංකාවේ වධහිංසාවට ලක්වූ පුද්ගලයා ඔහුගේ අත්දැකීම විස්තර කරයි. SLCAT [අන්තර්ජාල] 2021 අප්‍රේල් 2. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: https://www.slcat.org/sri-lankan-tortured-man-describes-his-experience /

38. යක්කලමුල්ල පොලිසිය පාරේ සිටි පුද්ගලයෙකුට පහර දෙයි ...! SLCAT [අන්තර්ජාල]. 2021 මැයි 28. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: https://www.slcat.org/yakkalamulla-police-assault-a-man-on-the-road /

39. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම හම්බන්තොට වරාය පොලිසිය පිළිබඳ පරීක්ෂණයක් ආරම්භ කරයි. SLCAT [අන්තර්ජාල]. 2021 ජූලි 13. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: https://www.slcat.org/hrcsl-launch-an-investigation-over-hambantota-port-police /

40. පාදුක්ක පොලිසියේ දී සිදු වූ ලිංගික හිංසනය පිළිබඳ තරුණ මවකගේ පැමිණිල්ල. SLCAT [අන්තර්ජාල]. 2021 ජූලි 21. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: https://www.slcat.org/the-complaint-by-a-young-mother-of-sexual-harassment-suffered-at-the-padukka-police-station /

41. බීමත් පොලිස් කොස්තාපල්වරයෙකු 16 හැවිරිදි සිසුන් දෙදෙනෙකුට පහර දෙයි.  SLCAT [අන්තර්ජාල]. 2021 ජූලි 10. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: https://www.slcat.org/a-drunken-police-constable-assaults-two-16-year-old-students /

42. කොටවිල පොලිසියේ ස්ථානාධිපතිවරයා සැකකරුවෙකුට විකට් පොල්ලකින් පහර දෙයි.  SLCAT [අන්තර්ජාල]. 2021 අගෝස්තු 11. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: https://www.slcat.org/kotawila-police-oic-assaulted-suspect-with-cricket-stump /

43. ශ්‍රී ලංකාව චෝදනා නොමැතිව මුස්ලිම් නීතීඥයෙකු මාස 6 ක් සිරගත කිරීමට හේතුව  | Human Rights News. Al Jazeera [අන්තර්ජාල]. 2020 ඔක්තෝබර් 15. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: https://www.aljazeera.com/news/2020/10/15/sri-lanka-muslim-lawyer

44. කවි අයුක්තිය: තවත් ලේඛකයෙක් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිරගතව සිටියි.  Daily FT [අන්තර්ජාල]. 2021 දෙසැම්බර් 14. ප්‍රවේශ විය හැකි වෙබ් අඩවිය: https://www.ft.lk/news/Poetic-injustice-Another-writer-languishes-in-prison-under-PTA/56-710172?fbclid=IwAR1779G53dn9hAvPMOxTT7IkwwTnUWcnoqzmlhaFudgOU2v9ImG6Mz1Njts